ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

109

මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2007

**ESD 1131 -** මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන පර්යාලෝකන

කාලය - පැය දෙකයි.

---

දිනය - 2007.12.08 වේලාව - පෙ.ව.10.00 - මධ්‍යාහ්න 12.00

---

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු ලියන්න.

01. i. 'අධ්‍යාපනයේ මූලික අරමුණ ළමයාගේ පූර්ණ සංවර්ධනයයි.' මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.
(ලකුණු 10)

ii. පෙර පාසල් වයසේ ළමුන්ගේ පූර්ණ සංවර්ධනය සඳහා ක්‍රීඩා ඉවහල් කරගත හැකි ආකාරය නිදසුන් දක්වමින් විස්තර කරන්න.
(ලකුණු 15)

02. i. මුල් ළමාවිය දරුවන්ගේ භාෂා සංවර්ධනය සඳහා නිවෙස් පරිසරය බලපාන අයුරු නිදසුන් දක්වමින් පරීක්ෂා කරන්න.
(ලකුණු 10)

ii. පෙර පාසල් දරුවන්ගේ භාෂා සංවර්ධනය සඳහා ගුරුවරියගේ කාර්ය වැදගත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.
(ලකුණු 15)

03. i. ළමයෙකුගේ නිවසේ පරිසරය ඔහුගේ චිත්තවේගී සංවර්ධනයට දායක වන අයුරු විග්‍රහ කරන්න.
(ලකුණු 10)

ii. දැඩි ආක්‍රමණශීලී ළමයෙකු ඔබේ පෙර පාසලේ සිටී යයි උපකල්පනය කරන්න.
මෙම දරුවා වෙනුවෙන් පන්තිකාමරය තුළ ඔබ භාවිතා කරන ක්‍රියාමාර්ග යෝජනා කරන්න.
(ලකුණු 15)

04. i. පවුලේ සාම්ප්‍රදායික භූමිකාව වෙනස්වීම කෙරෙහි බලපාන ලද සාධක පැහැදිලි කරන්න.
(ලකුණු 10)

ii. වර්තමාන න්‍යෂ්ටික පවුල ළමයෙකුගේ පෞරුෂය සංවර්ධනය කෙරෙහි කුමන අයුරින් බලපාන්නේදැයි විවේචනාත්මකව පරීක්ෂා කරන්න.
(ලකුණු 15)

05. i. ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනය යන සංකල්පය පැහැදිලි කරන්න.
(ලකුණු 05)

ii. ශිෂය කේන්ද්‍රිය අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් කරන්න.
(ලකුණු 20)

06. i. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ පසුබිම හා එය සංවර්ධනය වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

ii. 1972 සහ 1999 වර්ෂවල ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ප්‍රධාන ලක්ෂණ සන්සන්දනය කරන්න.

(ලකුණු 10)

\- හිමිකම් ඇවිරිණි. -